අරමුදල් කළමනාකරුගේ වාර්තාව

හිමිකම් අරමුදල (CT Smith Equity Fund)

හිතවත් ආයෝජකතුමනි/ආයෝජකතුමියනි,

2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සී.ටී.ස්මිත් ගිල්ට් එඩ්ජ් අරමුදලෙහි (CT Smith Equity Fund) හි වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීම පිළිබඳව අප සතුටු වන්නෙමු.

2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය (FY26) තුළ, සියලු කොටස් මිල දර්ශකය (ASPI) 33.2%ක[4] වර්ධනයක් වාර්තා කළ අතර, ඊට අනුරූප පෙර වර්ෂයේදී එය 38.2%ක[4] වර්ධනයක් වාර්තා කර තිබුණි. සියලු කොටස් සමස්ත ප්‍රතිලාභ දර්ශකය (ASTRI) 39.2%ක[4] ඉහළ යාමක් වාර්තා කළ අතර, ද්‍රවශීල S&P SL20 දර්ශකය 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ 24.7%ක[4] වර්ධනයක් වාර්තා කළේය. එම කාලය තුළ සී.ටී. ස්මිත් හිමිකම් අරමුදල 42.1%ක ප්‍රතිලාභයක් වාර්තා කරමින් සිය මිණුම් දර්ශකය වන ASPI අභිබවා කාර්යසාධනයක් පෙන්නුම් කළේය.

ආර්ථික සමාලෝචනය

2025 වර්ෂය තුළ රාජ්‍ය මූල්‍ය විනය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ලිහිල් මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය සිය යහපත් වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගත්තේය. ඒ අනුව, 2025 වර්ෂයේදී ශ්‍රී ලංකා ආර්ථිකය 5.0%ක[2] වර්ධනයක් වාර්තා කළ අතර, ඊට පෙර වර්ෂයේදීද 5.0%ක[2] වර්ධනයක් වාර්තා කර තිබුණි.

සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ (Real GDP) වර්ධනය පුළුල් පරාසයක පැවති අතර, ආර්ථිකයේ අංශ තුනම වසරින් වසර (YoY) වර්ධනයක් වාර්තා කළේය.

	2023		2024		2025	
	% Growth	% of GDP	% Growth	% of GDP	% Growth	% of GDP
කෘෂිකාර්මික	1.6	7.8	0.6	7.5	1.4	8.4
කාර්මික	-9.2	25.3	11.0	26.7	7.8	25.4
සේවා	-0.2	60.7	2.4	59.2	3.3	54.6
ද.දේ.නි.	**-2.3**		**5.0**		**5.0**	

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ලෝක ආර්ථික දැක්ම (World Economic Outlook – WEO) අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2026 වර්ෂයේදී 3.1%[3] දක්වා මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, 2027 වර්ෂයේදී එය 3.2%[3] දක්වා යළි වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම මන්දගාමී වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය අතර ඉරානය සම්බන්ධයෙන් පවතින යුද්ධය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය සැපයුම් දාමයන්ට මෙන්ම සමස්ත උද්ධමනයට ඇති වන බලපෑමයි.

<u>පොලී අනුපාත පරිසරය</u>

	නොවැ-24	දෙසැ-25
එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (%)	8.00	7.75
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (%)	2.00	2.00

Source: CBSL

ශ්‍රී ලංකා මහ බැංකුව 2026 මූල්‍ය වර්ෂය කාලසීමාව පුරා සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, 2025 මැයි මාසයේදී පදනම් අංක 25ක (25 bps) එක් වරක් පමණක් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අඩු කළේය. මේ අතර, විදේශ විනිමය සංචිත කඩිනමින් ගොඩනැගීම සඳහා ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් බැංකු අංශයේ ද්‍රවශීලතාව යහපත් මට්ටමක පවත්වා ගැනීමට හැකි විය. තවද, තනි ඉලක්කම් මට්ටමේ ණය පොලී අනුපාතික, ශක්තිමත් වූ ඉල්ලුම් තත්ත්වයන් සහ 2025 පෙබරවාරි මාසයේදී වාහන ආනයන තහනම ඉවත් කිරීම හේතුවෙන් 2026 මූල්‍ය වර්ෂ කාලසීමාව පුරා පෞද්ගලික අංශයේ ණය වර්ධන වේගය තවදුරටත් ශක්තිමත් විය. ඒ අනුව, 2026 මාර්තු මාසයේදී පෞද්ගලික අංශයේ ණය පෙර වසරට සාපේක්ෂව 27.0%[1]ක වර්ධනයක් වාර්තා කළේය.



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

	Oct-25	Nov-25	Dec-25	Jan-26	Feb-26	Mar-26
Pvt. Sector Credit Growth (%)	24.1	26.0	25.2	26.0	28.0	27.0

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

විදේශීය වෙළෙඳාම් අංශය

ආනයන වර්ධනය අපනයන වර්ධනය අභිබවා යාම හේතුවෙන් 2025 වර්ෂයේදී වෙළෙඳ භාණ්ඩ වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වී ඇමරිකානු ඩොලර් බිලියන 8කට ආසන්න මට්ටමකට[1] ළඟා විය.

2025 වර්ෂයේදී කාර්මික අපනයන පෙර වසරට සාපේක්ෂව 5.2%ක[1] වර්ධනයක් වාර්තා කළ අතර, ආහාර, පාන වර්ග සහ දුම්කොළ අපනයනවල සැලකිය යුතු 37.4%ක[1] වර්ධනය ඊට ප්‍රධාන වශයෙන් දායක විය. ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන අංශය වන ඇඟලුම් හා රෙදිපිළි අංශයද වසරින් වසර 5.0%ක[1] මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.

ආනයන සීමා ඉවත් කිරීමෙන් අනතුරුව පෞද්ගලික වාහන ආනයනය 24 ගුණයකින් ඉහළ යාම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වසරින් වසර 59.2%ක[1] සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ඉන්ධන ආනයන වසරින් වසර 7.2%ක[1] අඩුවීම හේතුවෙන් අතරමැදි භාණ්ඩ ආනයන සුළු වශයෙන් පහළ ගියේය.

පෞද්ගලික වාහන සහ ඉන්ධන ආනයන හැර සැලකූ විට, 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම වසරින් වසර 9.8%ක[1] වර්ධනයක් වාර්තා කළේය. ආයෝජන භාණ්ඩ ආනයනද පෙර වසරට සාපේක්ෂව 18.6%ක[1] ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර, එය ආර්ථිකය තුළ ප්‍රාග්ධන වියදම් (CAPEX) සඳහා වූ ඉල්ලුම වැඩිදියුණු වෙමින් පවතින බව පෙන්නුම් කරයි.

(ඇ.ඩො.මි. වලින්)	2024	2025	YoY Growth (%)	Oct-25	Nov – 25	Dec-25
අපනයන	12,772	13,581	*6.3%*	1,150	1,058	1,158
ආනයන	18,841	21,480	*14.0%*	2,157	1,778	2,155
වෙළෙඳ හිඟය	**-6,069**	**-7,899**		**-1,007**	**-720**	**-997**
සේවක ප්‍රේෂණ	6,575	8,076	*22.8%*	712	673	879
සංචාරක	3,169	3,219	*1.6%*	186	252	309
වර්තන ගිණුමේ හිඟය	1,316	1,719	*30.6%*	-219	67	18

මූලාශ්‍රය*: ශ්‍රී ලංකා මහ බැංකුව*

විනිමය අනුපාතික පරිසරය

ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව අඛණ්ඩව වසර දෙකක් ද්විත්ව ඉලක්කම් ප්‍රතිශතයකින් අගය ඉහළ යාමෙන් අනතුරුව, 2025 දෙසැම්බර් 31 වන දින වන විට ශ්‍රී ලංකා රුපියල (LKR) පෙර වසරට සාපේක්ෂව 5.6%ක[1] අවප්‍රමාණයකට ලක්ව රු. 309.99ක් දක්වා පහළ ගියේය.

2025 වර්ෂයේදී ශ්‍රී ලංකාව සිය බාහිර ජංගම ගිණුමේ අතිරික්තය තවදුරටත් වර්ධනය කරගත්තද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහන යටතේ නියම කර ඇති ශුද්ධ ජාත්‍යන්තර සංචිත (NIR) ඉලක්ක සපුරාලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් අඛණ්ඩව ඇමරිකානු ඩොලර් මිලදී ගැනීම සහ ඉහළ මට්ටමක පැවති විදේශ මුදල් ණය ආපසු ගෙවීම් හේතුවෙන් ශ්‍රී ලංකා රුපියලේ දුර්වලතාව ඇති වූ බව අපගේ අදහසයි.

2026 මැයි මාසය අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල විදේශ සංචිත ඇස්තමේන්තුගත වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 6.9ක්[1] දක්වා ඉහළ ගොස් තිබූ අතර**,** එයට භාවිතය

සම්බන්ධයෙන් කොන්දේසි පනවා ඇති චීන මහජන බැංකුවේ (PBoC) ස්වැප් පහසුකමක්ද ඇතුළත් වේ.



Source: CBSL

උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (CCPI, 2021=100) වසරින් වසර වෙනස්වීම මගින් මනිනු ලබන සමස්ත උද්ධමනය (Headline Inflation) 2025 ජූලි මාසය දක්වා අවධමනකාරී ප්‍රවණතාවක් අනුගමනය කළ අතර, ඉන් අනතුරුව මධ්‍යස්ථ ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. 2025 දෙසැම්බර් මස අවසානය වන විට උද්ධමනය ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මධ්‍යකාලීන ඉලක්ක පරාසය වන 3%–7% හි පහළ සීමාවට වඩා පහළ මට්ටමක පැවතුණි. ඉල්ලුම් තත්ත්වයන්හි සැලකිය යුතු වැඩිදියුණුවක් පැවතියද, ඉන්ධන මිල ගණන් පහළ යාමෙන් ඇති වූ ප්‍රතිලාභය සහ ගෝලීය භාණ්ඩ මිල ගණන්වල ස්ථාවරත්වය හේතුවෙන් උද්ධමන පීඩනය අවම විය. කෙසේ වෙතත්, ඉරාන යුද්ධය ආරම්භ වීමෙන් අනතුරුව ගෝලීය බලශක්ති මිල ගණන්වල සිදුවූ තියුණු ඉහළ යාම සහ එහි ද්විතීයික බලපෑම් හේතුවෙන් සමස්ත උද්ධමනය 2026 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍යකාලීන ඉලක්කය වන 5.0% ඉක්මවා ගියේය. 2026 මැයි මාසයේදී එය 5.5%[2]ක් දක්වා ඉහළ ගොස් තිබූ අතර, එය කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI, 2021=100) මත පදනම් වේ.



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය මූල්‍ය ගිණුම්

රාජ්‍ය මූල්‍ය ආදායම රු. ට්‍රිලියන 5.5කට ආසන්න[5] (දළ දේශීය නිෂ්පාදිතයෙන් 16.7%) මට්ටමක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එය පෙර වසරට සාපෙක්ෂව 34.1%ක[5] සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ආර්ථික ක්‍රියාකාරකම්වල සිදු වූ වැඩිදියුණුවත් සමඟ මෝටර් රථ ආනයනය යළි ආරම්භ වීමෙන් ලැබුණු ආදායම සහ භාණ්ඩ හා සේවා මත අය කෙරෙන ඉහළ බදු ආදායම් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය.

ඉහළ ගිය සමාගම් ලාභදායීතාව සහ බදු ආදායම් එකතු කිරීමේ හා පරිපාලනයේ වැඩිදියුණුව හේතුවෙන් ආදායම් මත බදු ආදායමද පෙර වසරට සාපෙක්ෂව 11.0%කින් ඉහළ ගියේය. ඒ අනුව, 2025 වර්ෂය සඳහා බදු ආදායම් එකතු කිරීම සහ ප්‍රාථමික අතිරික්තය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් නියම කර තිබූ ප්‍රමාණාත්මක කාර්යසාධන ඉලක්ක ශ්‍රී ලංකා රජය සාර්ථකව සපුරාලීය.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පුනරාවර්තන වියදම් 16.0%[5] දක්වා අඩු වූ අතර, ඊට පොලී ගෙවීම් පහළ යාම සහ භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රජය සිය රාජ්‍ය ආයෝජන අයවැය තවදුරටත් අපේක්ෂිත මට්ටමින් භාවිතයට නොගත් අතර, ප්‍රාග්ධන වියදම් (CAPEX) දළ දේශීය නිෂ්පාදිතයෙන් 3.1%කට පමණක් සීමා විය.

මීට අමතරව, ඩිට්වා ආපදා තත්ත්වයට අදාළ ප්‍රතිසංස්කරණ සහ සහන කටයුතු සඳහා රු. බිලියන 500ක් නැවත වෙන් කරමින් අතිරේක අයවැයක් ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව, 2026 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.5% සිට 1.0% දක්වා පහළට සංශෝධනය කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනේ පස්වන සහ හයවන ඒකාබද්ධ සමාලෝචනයට අනුව, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය ආදායම 2026 වර්ෂයේ අවසානයේදී සහ 2027 වර්ෂයේ අවසානයේදී පිළිවෙළින් 15.2%[3] සහ 15.1%[3] දක්වා සාමාන්‍යකරණය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2025 වර්ෂයේදී මෝටර් රථ ආනයනයේ සිදු වූ ඉහළ යාමෙන් අනතුරුව, ඉදිරියේදී එම ආනයන සාමාන්‍ය මට්ටමකට පත්වනු ඇතැයි අපේක්ෂා කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වේ.

අයිතමය	2023 රු.බි.	2024 රු.බි.	2025 (තාවකාලික) රු.බි.	2026 (ඇස්තමේන්තුගත) රු.බි.
මුළු ආදායම	3,074	4,091	5,486	5,300
ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස	*11.1*	*13.6*	*16.7*	*15.4*
මුළු වියදම	5,357	6,131	6,230	7,557
ප්‍රාථමික අතිරික්තය / (හිඟය)	**173**	**650**	**1,756**	**360**
ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස	*0.6*	*2.2*	*5.4*	*1.0*

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය, 2026 අයවැය සහ 2026 අතිරේක අයවැය

වෙළෙඳපොළ සමාලෝචනය

බාහිර කම්පනකාරී සිදුවීම් රැසකට මුහුණ දුන්නද, මධ්‍යස්ථ පොලී අනුපාත, ස්ථාවර සාර්ව ආර්ථික තත්ත්වයන් සහ සමාගම්වල ඉපැයීම්වල යහපත් වර්ධනය හේතුවෙන් ආයෝජක විශ්වාසය අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි වූ අතර, කොළඹ කොටස් හුවමාරුව (CSE) පෙර මූල්‍ය වර්ෂයේ සිට පැවති සිය ඉහළ යාමේ ප්‍රවණතාව තවදුරටත් පවත්වා ගත්තේය. මූල්‍ය වර්ෂය ආරම්භ වූයේ එක්සත් ජනපද පරිපාලනය විසින් හඳිසියේ දැඩි ප්‍රතිපාර්ශ්වික තීරුබදු

ප්‍රකාශයට පත් කිරීමත් සමඟ වන අතර, ඉරානයේ න්‍යෂ්ටික පහසුකම් වෙත එක්සත් ජනපද හමුදාව විසින් එල්ල කරන ලද ගුවන් ප්‍රහාර හේතුවෙන් තත්ත්වය තවදුරටත් සංකීර්ණ විය. මෙම පුවත් හමුවේ වෙළෙඳපොළ සෘණාත්මක ප්‍රතිචාරයක් දැක්වුවද, පසුව ප්‍රතිපාර්ශ්වික තීරුබදු අනුපාත අඩු කිරීම සහ ඉරානය සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ හමුදා මැදිහත්වීම කෙටි කාලයකට සීමා වීම පිළිබඳ නිවේදන නිකුත් වීමත් සමඟ වත්කම් මිල ගණන් ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් විය. වැඩිදියුණු වූ වෙළෙඳපොළ විශ්වාසය සහ අතිරික්ත ද්‍රවශීලතාව සමඟ 2025 මැයි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතය අඩු කිරීම, 2025 මැයි සිට නොවැම්බර් දක්වා අඛණ්ඩව මාස හයක් කොළඹ කොටස් වෙළෙඳපොළේ වර්ධනයට දායක විය. කෙසේ වෙතත්, 2025 වසරේ අවසාන භාගයේදී ඩිට්වා සුළි කුණාටුව හේතුවෙන් වෙළෙඳපොළේ පැවති වර්ධන වේගය තාවකාලිකව අඩාල විය. එහෙත්, 2026 වසරේ ආරම්භයේදී ආයෝජකයින් වාර්ෂික ලාභාංශ අපේක්ෂාවෙන් බැංකු අංශයේ කොටස් වෙතත්, ශ්‍රී ලංකා රජය විසින් සිදු කිරීමට අපේක්ෂිත ප්‍රතිසංස්කරණ වියදම් හේතුවෙන් ඉදිකිරීම් ආශ්‍රිත සමාගම් වෙතත් ආයෝජනය කිරීමත් සමඟ වෙළෙඳපොළ යළි ශක්තිමත් විය. කෙසේ වෙතත්, පෙබරවාරි මස අග භාගයේදී එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය ඉරානයට එරෙහිව ඒකාබද්ධ හමුදා ප්‍රහාර ආරම්භ කිරීමත් සමඟ ආයෝජක මනෝභාවය යළිත් දැඩි ලෙස අහිතකර බලපෑමකට ලක් විය. වෙළෙඳපොළේ අස්ථාවරත්වය ඉහළ මට්ටමක පැවතියද, සියලු කොටස් මිල දර්ශකය (ASPI) තවත් ශක්තිමත් වාර්ෂික වර්ධනයක් වන 33.2%ක[4] වර්ධනයක් වාර්තා කළ අතර, වඩාත් ද්‍රවශීල S&P SL20 දර්ශකය වසරින් වසර 24.7%ක[4] වර්ධනයක් වාර්තා කළේය. තවද, ආයෝජක මනෝභාවයේ උච්චාවචනයන් සහ සැලකිය යුතු විදේශීය විකුණුම් පැවතියද, වෙළෙඳපොළේ සාමාන්‍ය දෛනික පිරිවැටුම වසරින් වසර 131.2%ක[4] කින් ඉහළ ගොස් රුපියල් මිලියන 5,179ක්[4] බවට පත්විය. එසේම, දර්ශකයේ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2025 දෙසැම්බර් 31 වන විට රුපියල් බිලියන 8,069ක්[4] දක්වා ඉහළ ගිය අතර, එය නාමික දළ දේශීය නිෂ්පාදිතයේ 24.6%කට සමාන විය.

මීට අමතරව, වසර තුළ නව CDS ගිණුම් 57,458ක් විවෘත කර ඇති අතර, එය පෙර වසරට සාපේක්ෂව තුන් ගුණයක වැඩිවීමකි. ඒ අනුව, CDS ගිණුම් සංඛ්‍යාව මිලියනයේ සීමාව ඉක්මවා ගොස් 2025 දෙසැම්බර් 31 වන විට CDS ගිණුම් 1,066,499ක් ලෙස වාර්තා විය.

වෙළෙඳපොළ නිර්ණායක	31-Mar-23	31-Mar-24	31-Mar-25	31-Mar-26
ASPI (% YoY)	4.5	23.0	38.2	33.2
ASTRI (% YoY)	4.5	26.9	46.4	39.2
S&P SL20 (% YoY)	-11.5	23.7	42.7	24.7
Market Capitalization (Rs bn)*	3,903.5	4,535.0	5,696.0	8,068.6
Average Daily Turnover (Rs mn)**	2,143.5	1,579.9	2,240.0	5,179.0
Market PER (X)	5.0	9.9	8.3	10.6
Net Foreign Flow (Rs bn)	33.0	-4.1	-12.7	-47.7

2025 දෙසැම්බර් 31 වන විට.

** 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කැලැන්ඩර් වර්ෂය සඳහා

මූලාශ්‍රය: කොළඹ කොටස් වෙළෙඳපොළ දත්ත



මූලාශ්‍රය: කොළඹ කොටස් වෙළෙඳපොළ දත්ත

සී. ටී.ස්මිත් හිමිකම් අරමුදලේ කාර්යසාධනය

සී. ටී.ස්මිත් හිමිකම් අරමුදල සමාලෝචනයට ලක් කරන ලද මූල්‍ය වර්ෂය තුළ 42.1%ක වර්ධනයක් වාර්තා කරමින්, ASPI හි 33.2%ක වර්ධනය අභිබවා කාර්යසාධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, පසුගිය වසර පහ තුළ අරමුදල 29.1%ක සංයුක්ත වාර්ෂික වර්ධන

අනුපාතයක් (CAGR) වාර්තා කර ඇති අතර, එය ASPI හි 24.2%ක අනුපාතයට සාපේක්ෂව ඉහළ අගයකි. 2026 මූල්‍ය වර්ෂය තුළදී, අරමුදල කොටස් ආයෝජන සඳහා සාපේක්ෂව ඉහළ උපායමාර්ගික ප්‍රමුඛතාවක් අඛණ්ඩව පවත්වා ගත් අතර, මිල චලනයන් සහ වෙළෙඳපොළ වර්ධනයන් මත පදනම්ව වත්කම් වෙන්කිරීම සම්බන්ධයෙන් නිතිපතා උපක්‍රමශීලී තීරණ ගනු ලැබීය. වෙළෙඳපොළ ශක්තිමත් අවස්ථාවලදී ලාභයේ කොටසක් සාක්ෂාත් කර ගනිමින්ද, වෙළෙඳපොළ දුර්වල අවස්ථාවලදී ආයෝජන ස්ථාන තවදුරටත් ගොඩනඟා ගනිමින්ද අරමුදල සිය ආයෝජන උපායමාර්ගය ක්‍රියාත්මක කළේය. ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම, පෞද්ගලික අංශයේ ණය වර්ධනයේ ශක්තිමත් වේගය සහ පාරිභෝගික හා ඉදිකිරීම් ඉල්ලුමේ අඛණ්ඩ වැඩිදියුණුව හේතුවෙන් ප්‍රතිලාභ ලැබූ ප්‍රාග්ධන භාණ්ඩ, බැංකු, ද්‍රව්‍ය සහ ප්‍රවාහන යන අංශයන්හි අරමුදල සිය වැඩි බරක් සහිත ආයෝජන අඛණ්ඩව පවත්වා ගත්තේය. කොටස් තෝරාගැනීමේදී ගුණාත්මකභාවය මූලික කරගත් සාධක පහක් කෙරෙහි අවධානය යොමු කරන අරමුදලේ “Quintuple Foundation” ආයෝජන උපායමාර්ගය, පසුගිය වසර තුන තුළ ලුහුබැඳීමේ දෝෂය (Tracking Error) 5.7%ක මට්ටමක පවත්වා ගැනීමට උපකාරී වූ අතර, එමගින් වෙළෙඳපොළ ප්‍රතිලාභවල දක්නට ලැබුණු අධික අස්ථාවරත්වයෙන් ඒකක හිමියන් ආරක්ෂා කිරීමට දායක විය.

ඉහළම කාර්යසාධනක් සහිත ව්‍යාපාර ක්ෂේත්‍ර 5	බර තැබීම (%)
ප්‍රාග්ධන භාණ්ඩ	**28.3%**
බැංකු	**25.3%**
අමුද්‍රව්‍ය	**10.3%**
ප්‍රවාහන	**10.1%**
විදුලි සංදේශ සේවා	**5.0%**

ඉහළම කාර්යසාධනය සහිත සමාගම් 05	බර තැබීම (%)
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් - ඡන්දබලය සහිත	**10.1%**
ඩිජිටල් මොබිලිටි සොලූෂන්ස්	**9.4%**
ඇක්සස් ඉංජිනියරිං	**8.1%**
හේමාස් හොල්ඩිංග්ස්	**5.5%**
හැටන් නැෂනල් බැන්ක්	**5.0%**





මූලාශ්‍රය: *CSE* දත්ත, *CEF* තොරතුරු පත්‍රිකා/මාසික පුවත්ලිපි

අපේක්ෂාවන්, ඉදිරි දැක්ම සහ උපායමාර්ගය

2023 ජූනි මාසයේදී ආරම්භ වූ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ චක්‍රයේ ආරම්භයේ සිට, පාලිත උද්ධමනය, රාජ්‍ය මූල්‍ය ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් සහ බාහිර ජංගම ගිණුමේ අතිරික්තයක් මගින් පෙන්නුම් කළ පරිදි, මුදල්, රාජ්‍ය මූල්‍ය සහ බාහිර අංශවල සාපේක්ෂ ස්ථාවරත්වයෙන් ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිලාභ ලබා ඇත. මෙම හිතකර සාර්ව ආර්ථික පසුබිම හේතුවෙන් දේශීය පොලී අනුපාත ස්ථාවරව පවත්වා ගැනීමට හැකි වූ අතර, අවදානම් සහිත වත්කම් සඳහා හිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය විය. මීට පෙර සඳහන් කළ පරිදි, 2026 මූල්‍ය වර්ෂය තුළ බාහිර කම්පන කිහිපයකට මුහුණ දීමට සිදු වූ නමුත්, පසුගිය වසර තුන තුළ ගොඩනගා ගත් රාජ්‍ය මූල්‍ය සහ බාහිර අංශයේ ආරක්ෂිත සංචිතවල සහාය මත දේශීය ආර්ථිකය ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, එක්සත් ජනපදය/ඊශ්‍රායලය සහ ඉරානය අතර පැවති යුද්ධයේ දිග්ගැස්සුණු ස්වභාවය සහ එහි ප්‍රතිඵලයක් ලෙස තීරණාත්මක නාවික මාර්ගයක් වන හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීම, ශ්‍රී ලංකාවේ බාහිර අංශයට සහ දේශීය මිල මට්ටම්වලට සැලකිය යුතු පීඩනයක් එල්ල කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමටත්, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ චක්‍රය අවසන් කිරීමටත් කටයුතු කළේය. එමෙන්ම, වඩාත් ඉහළ ගිය විනිමය අනුපාත අස්ථාවරත්වය සමනය කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වීමටත්, බැංකු පද්ධතියේ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් සිදු කිරීමටත් මහ බැංකුවට සිදු විය.

මෙම පසුබිම තුළ, 2027 මූල්‍ය වර්ෂයේ පළමු මාස දෙක තුළ කොළඹ කොටස් හුවමාරුවේ දෛනික පිරිවැටුම සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇති අතර, එම කාලසීමාව තුළ සියලු කොටස් මිල දර්ශකය (ASPI) 5.9%කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ඉරානයේ ගැටුම

සමනය වීම (ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම මගින් තහවුරු වූ පරිදි) සහ හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ටැංකි නෞකා ගමනාගමනයේ අනුක්‍රමික ප්‍රගතිය හේතුවෙන් බලශක්ති සහ අනෙකුත් බලපෑමට ලක් වූ භාණ්ඩවල මිල පහළ යාමට පීඩනයක් ඇති වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, දිගුකාලීනව ඉහළ උද්ධමනයක් පැවතීම, ශ්‍රී ලංකා රුපියලේ දැඩි අවප්‍රමාණය වීම සහ මහ බැංකුව විසින් දැඩි මුදල් ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සිදු කිරීම යන අවාසිදායක අවදානම් සැලකිය යුතු ලෙස අඩු වී ඇති බව අපගේ අදහස වන අතර, එය 2026 වසර අවසානයේ ඉතිරි කාලය තුළ අවදානම් සහිත වත්කම් සඳහා හිතකර තත්ත්වයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරමු. ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් ලකුණු 100කින් ඉහළ නැංවීමක් සිදු කර තිබුණද, බදු සලකා සකස් කළ සැබෑ පොලී අනුපාත තවදුරටත් පහළ මට්ටමක පවතින බැවින් ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළෙන් සැලකිය යුතු ප්‍රාග්ධන පිටතට ගලායාමක් සිදුවීම සීමා වී ඇත. එමෙන්ම, කොටස්වලින් උපයන ලාභාංශ සඳහා පමණක් ආදායම් බදු අදාළ වීම හේතුවෙන් ශ්‍රී ලංකා කොටස් ආයෝජනවලට බදු කාර්යක්ෂමතාවයේ අමතර වාසියක් හිමි වේ. වටිනාකම් තක්සේරු කිරීමේ දෘෂ්ටිකෝණයෙන් බැලූ විට, දර්ශකය අඛණ්ඩව වසර තුනක් ශක්තිමත් වර්ධනයක් වාර්තා කර තිබුණද, මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් 2024 වසරේ එක්වරක් පමණක් ලැබුණු ලාභවල බලපෑම ඉවත් කර සකස් කළ 2025 වසරේ සමාගම් ඉපැයීම් 42%ක වාර්ෂික වර්ධනයක් වාර්තා කිරීම මගින් ශක්තිමත් පදනමක් සපයා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳපොළ මේ වන විට එහි ඓතිහාසික සාමාන්‍ය අගයට අනුකූලව ගනුදෙනු වන අතර, 2026 වසර අවසානයේදී සමාගම් ඉපැයීම් සැළකිය යුතු වර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, ඉදිරියේදී වෙළෙඳපොළ වටිනාකම් තක්සේරුව තවදුරටත් ඉහළ යාම සඳහා අවකාශ පවතී. නුදුරු කාලීනව, ඉහළ යන වටිනාකම් තක්සේරු කිරීම් සහ ඉපැයීම් වර්ධනය පිළිබඳ වැඩිදියුණු වන අපේක්ෂාවන්, විශේෂයෙන්ම අපගේ ආයෝජන කළඹට අයත් සමාගම් සම්බන්ධයෙන් ඇති වන මිල ඉහළ යාමේ අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම සඳහා, අරමුදල තුළ කොටස් සඳහා අධි බරක් පවත්වාගෙන යාමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු. දර්ශකයේ වටිනාකම් තක්සේරුව මේ වන විට එහි ඓතිහාසික සාමාන්‍ය මට්ටමට ළඟා වී ඇති බැවින්, ආයෝජන කළඹේ අන්තර්ගත කොටස් සංඛ්‍යාව අඩු කිරීමට අරමුදල අපේක්ෂා කරන අතර, ප්‍රාග්ධන භාණ්ඩ, බැංකු, ප්‍රවාහන සහ ද්‍රව්‍ය යන අංශවල ඉහළ විශ්වාසයක් සහිත තෝරාගත් ආයෝජන සඳහා වැඩි ක්‍රියාකාරී බරක් ලබා දීමට කටයුතු කරනු ඇත. මධ්‍ය කාලීනව ද්විත්ව ඉලක්කම් මට්ටමේ මැද අගයක කොටස් හිමිකම් මත ප්‍රතිලාභ (RoE) අපේක්ෂා කෙරෙන පසුබිමක බැංකු අංශයේ තවදුරටත් පවතින වටිනාකම් වට්ටම, පාරිභෝගික ඉල්ලුම මත මෙහෙයවෙන පරිභෝජන වර්ධනයේ තිරසාර ප්‍රතිසාධනය සහ වසරේ දෙවන භාගයේදී ඉදිකිරීම් ක්‍රියාකාරකම් ඉහළ යාම, මධ්‍ය කාලීනව අරමුදල සඳහා අතිරේක ප්‍රතිලාභ (alpha) උත්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ. තිරසාර ඉපැයීම් වර්ධනය, ශක්තිමත් නිදහස් මුදල් ප්‍රවාහ උත්පාදනය, ව්‍යාපාර චක්‍රයේ මැද අවධියේ ඉහළ කොටස් හිමිකම් මත ප්‍රතිලාභ සහ ලාභදායීතා ආන්තික, උද්‍යෝගී හා දක්ෂ කළමනාකරණ කණ්ඩායම් සහ සාධාරණ වටිනාකම් තක්සේරු කිරීම් වැනි මූලික ගුණාංගවලින් සහාය ලබන

සමාගම්වල විවිධාංගීකරණය වූ ආයෝජන කළඹක් පවත්වාගෙන යාම මත පදනම් වූ අරමුදලේ ආයෝජන උපායමාර්ගය, මධ්‍ය කාලීනව එහි ඒකක හිමියන් සඳහා සාමාන්‍යයට වඩා ඉහළ අවදානම්-ගැළපූ ප්‍රතිලාභ උත්පාදනය කිරීම අරමුණු කරයි.

1. ශ්‍රී ලංකා මහ බැංකුව (**www.cbsl.gov.lk**)
2. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (**www.census.gov.lk**)
3. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (**www.imf.org**)
4. කොළඹ කොටස් හුවමාරුව (**www.cse.lk**)
5. මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (**www.treasury.gov.lk**)